කෝරලේපත්තු බටහිර ප්‍රාදේශීය සභාව
---------------------------------------------
මඩකලපුව දිස්ත්‍රික්කය
-----------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2016 ජූනි 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී පරිගණකයක් හා වොයිස් රොකෝඩරයක් මිල දී ගැනීම පිණිස වියදම් කළ රු.261, 000 ක මුදල පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී විදුලි බුබුළු සහ අළුත්වැඩියා කටයුතු සඳහා වියදම් කළ රු.208,416 ක මුදල ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 ලැබිය යුතු ගිණුම්**

අය කර ගත යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තුව වන රු.160 ,500 ක මුදල අවුරුදු හතකට වඩා වැඩි කාලයක සිට අය කර ගැනීමට කටයුතු නොකර හිඟ වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවතුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබිණි.

| විෂයය | වටිනාකම ( රුපියල් ) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 35 ,936 ,292 | ඉඩම් හිමිකම් ඔප්පු |
| යන්ත්‍රෝපකරණ | 441 ,876 | ස්ථාවර වත්කම් ලේඛන |
| ලී බඩු හා උපකාරක | 1,510 ,042 | ස්ථාවර වත්කම් ලේඛන |

**1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ සමග අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති**<br>1 පරිච්ඡේදයේ 5(12) රීති | මුදල් සහ ගබඩා වගකීම් රාජකාරි මට්ටමෙන් නිලධාරීන් තුන් දෙනෙකුට භාරදී ඇතත් එම අයගෙන් සුරැකුම් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 571 දරන මුදල් රෙගුලාසිය | අවුරුදු 05 කට වඩා ගත වී ඇති රු.3,319,025 ක කල් ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.3,075, 174 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 2,327,190 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.747,984 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**2.2 ආදායම් කළමනාකරණය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාව විසින් ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම පහත දැක්වේ.

| ආදායම් වර්ගය | ඇස්තමේන්තුගත ආදායම 2015 | තථ්‍ය ආදායම 2015 | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| දඩ ගාස්තු | 2,341,234 | 3,550,997 | 1,792,154 |
| බදු | 445,000 | 624,500 | 421,000 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඔිට්ටමාවඩියේ මාළු මාකට් කඩ 31 ක් සාදා 2015 පෙබරවාරි 25 දින සභාවට භාර දී තිබූ නමුත් 2016 මැයි 31 දින දක්වා මෙම කඩ බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවකයන් 15 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත දිනවල ගෙවීමට අපොහොසත් වූ හෙයින් රු.16,218 ක් අමතර ගාස්තුව වශයෙන් සමාලෝචිත වර්ෂයේ දී ගෙවීමට සිදු විය.

(ඇ) වාලච්චේනේ කඩදාසි කම්හලෙන් ලබා ගත යුතු වරිපනම් රු.11,937,904 ක හිඟ මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාන මාරු ලබා ගිය, සේවය අත්හිටුවනු ලැබූ සහ සේවයෙන් විශ්‍රාම ගත් සේවකයන් දහ දෙනෙකුට ලබා දී ඇති ණය මුදල්වලින් අය කළ යුතුව තිබුණු රු.90,791 ක මුදල 1978 වර්ෂයේ සිට හිඟ වශයෙන් දැක්වුවත් එම මුදල ඔවුන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් හෝ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය**

**----------------------------------------**

**අය වැය පාලනය**

**--------------------**

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 25% සිට 144% දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5 .** **පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ආදායම් කළමනාකරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය